මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

# සැකකටයුතු ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම පිළිබඳ නීතිමය බැඳීම

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2017 අප්‍රේල් මස 21 දිනැති, අංක 2015/56 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 33 වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති ආයතන සඳහා වන සැකකටයුතු ගනුදෙනු (ආකෘති) වාර්තා කිරීම් සඳහා වන ආකෘති පත්‍රය ඉදිරිපත් කොට ඇත.

ඒ අනුව, පහත සඳහන් නම්කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් තම ආයතනය හරහා සිදුවන යම් ගනුදෙනුවක් මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 33 වගන්ති ප්‍රකාරව නීති විරෝධී/ සාපරාධී වරදකට සම්බන්ධ බවට සැක කිරීමට සාධාරණ පදනමක් පවතී නම් එය මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට බැඳී සිටින බව දැනුම්වත් කිරීම මෙම දැන්වීමේ අරමුණයි.

(අ) පෞද්ගලික හා සාමූහික මූල්‍ය කළඹ කළමනාකරණය කිරීම;

(ආ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් අරමුදල් හෝ මුදල් ආයෝජනය කිරීම, පරිපාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම;

(ඇ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් මුදල් හෝ ද්‍රවශීල ඇප සුරැකිව තබාගැනීම හා පරිපාලනය කිරීම;

(ඈ) මනා රැකවරණ සේවා;

(ඊ) භාරකාර පරිපාලනය හෝ ආයෝජන කළමනාකරණය හෝ අධිවෘද්ධක්ව යෝජනා ක්‍රමයක්;

(උ) කැසිනෝ, සූදු ගෙවල් හෝ තම ගනුදෙනුකරුවන්, මූල්‍යමය ගනුදෙනුවල යෙදී සිටින විට, අන්තර්ජාලය මඟින් එවැනි යම් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තෙකු ද ඇතුලුව ලොතරැයියක් පවත්වාගෙන යාම;

(ඌ) නිශ්චල දේපළ මිලට ගැනීම හා විකිණීමට අදාළව, තම සේවාදායකයන් සඳහා ගනුදෙනුවල යෙදුණු නිශ්චල දේපළ අනුයෝජිතයන්;

(එ) ගනුදෙනුකරුවකු, සමඟ මුදල් ගනුදෙනුවල නිරතවන විට, 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ පනතින් ආවරණය වන ලෝහ හා ගල් ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ, වටිනා ලෝහ වෙළඳුන් සහ අගනා සහ අර්ධ අගනා ගල් වර්ග වෙළඳුන්;

(ඒ) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි, 33 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි, තම සේවාදායකයන් වෙනුවෙන් ගනුදෙනු සඳහා සූදානම් වනවිට හෝ ඒවා කරගෙන යන විට, නීතීඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් හා ගණකාධිකාරිවරුන්;

(ඔ) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි, 33 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි සේවාවන් එකක් හෝ වැඩි ගණනක් සපයන්නා වූ භාරයක් හෝ සමාගම් සේවා සපයන්නෙක්;

(ඕ) වෙනත් ලිඛිත නීතිවල දී ඇති අර්ථකථනවලට අනුකූලව පිහිටුවා ඇති අක් වෙරළ ඒකක.

ඒ අනුව ඉහත නම්කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් තම ආයතනය මඟින් හඳුනා ගන්නා සැකකටයුතු ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම සඳහා එම ගැසට් නිවේදනයේ දැක්වෙන V වන උප ලේඛනය භාවිත කළ යුතුය.

**අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය**
**ශ්‍රී ලංකා මහා බැංකුව**
**නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.**

**☎ 011-2477125 🖶 011-2477692/2477722 @ str@fiusrilanka.gov.lk**